# ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨ පුස්තකාල පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා : රාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ඩී.පී.අයි.එන්. ජයසූරිය*[1]
*ඩබ්ලිව්.ඒ.වීරසූරිය*[2]

---

**සංක්ෂේපය**

දුප්පත්කමට එරෙහි පැරණිතම පියවර සංක්‍රමණ වන අතර තාවකාලික ග්‍රාමීය නාගරික ශ්‍රම සංක්‍රමණ සංවර්ධනය වන ලෝකයේ පොදු සංසිද්ධියක් බවට පත්ව තිබේ. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණයේ ස්වභාවය හඳුනාගැනීමේදී විසිවන සියවසේ මැද භාගය දක්වාම බහුල වශයෙන්ම ශ්‍රී ලංකා සමාජය තුළ සිදුවූයේ අභ්‍යන්තර සංක්‍රමණ බව පෙනේ. 1977 වර්ෂයේ ඇතිවූ විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග තරුණ ජනතාව කර්මාන්ත වල සේවා නියුක්ත වීම සඳහා ගමෙන් නගරයට සංක්‍රමණය වීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ලැබේ. එහෙත් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ශ්‍රම සංක්‍රමණ පිළිබඳව සිදුකර ඇති පර්යේෂණ වල පවතින ඌනතාවය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශයන්හි දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ග්‍රාමීය නාගරික සංක්‍රමණ හා ප්‍රේෂණ කොතෙක් දුරට ඉවහල් වන්නේද යන අරමුණ පාදක කරගෙන මෙම අධ්‍යයනය සිදු කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ 2015 වර්ෂයේ අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ ග්‍රාමීය ප්‍රදේශවල සිට ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සංක්‍රමණය වූ තාවකාලික ශ්‍රම සංක්‍රමණිකයින් 75 කින් ලබා ගන්නා ලද තොරතුරු මත පදනම්ව මෙම අධ්‍යයනය සිදුකර තිබේ. ප්‍රශ්නාවලියක් සැපයීම මඟින් සංක්‍රමණය වීමට පලපෑ හේතු, ආදායම් මට්ටම, ප්‍රේෂණය කරන ආකාරය හා භාවිතා කරන ආකාරය, ප්‍රේෂණය කරන කාලසීමාව, සංක්‍රමණිකයින්ගේ රැකියාවේ ස්වභාවය, සංක්‍රමණිකයින්ගේ ජීවන තත්වයේ සිදුවී ඇති වෙනස්කම්, අනාගත අභිවෘද්ධිය සඳහා ප්‍රේෂණ යොදවා ඇති ආකාරය පිළිබඳ විස්තර ලබා ගැනීම සිදුවිය. එම ලබාගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම ඇසුරින් විශ්ලේෂණය කිරීමෙන් ලබාගත් නිගමන ලෙස ප්‍රේෂණය කරන මුදල් ප්‍රමාණය සමස්ත ආදායමෙන් 43.12% ක් බව සොයා ගෙන තිබේ. වාහන හා ඉඩම් ඇතුළු වත්කම් මිලදී ගැනීම 31.88% ක සැළකිය යුතු දායකත්වයක් සංක්‍රමණ හරහා ලැබෙන බව සොයාගෙන තිබේ. මෙම සංක්‍රමණිකයින්ගෙන් 34.78% ක් නව නිවාස ඉදිකර ගෙන ඇති බව තහවුරු වේ. අධ්‍යාපනය ලබන සිසුන් සිටින නිවාසවලට ප්‍රේෂණය කිරීමේ වැඩි නැඹුරුතාවයක් තිබෙන බවත් එම ප්‍රමාණය සමස්ථ සංක්‍රමණිකයින්ගෙන් 8.69% ක් බව සොයා ගෙන තිබේ. ග්‍රාමීය නාගරික සංක්‍රමණ හරහා උපයන ප්‍රේෂණ පරිභෝජනය සඳහා පමණක් නොව ආයෝජනය සඳහාද යෙදවෙන බව තහවුරු වන මෙහි ආදායමින් 18.8% ක් පමණ තැන්පත් ධනයක් ලෙස ආයෝජනය කරන බව පෙනී යයි. එවගේම ව්‍යාපාරික කටයුතු සඳහා 2.89% ක්ද, කුඹුරු වැනි වත්කම් මිලදී ගැනීම සඳහා 2.89% ක් ද සංක්‍රමණිකයින්ගේ ප්‍රේෂණ යොදවා තිබේ. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල බුද්ධිගලනය අවම කිරීම සඳහා වඩාත් හොඳ විසඳුමක් වී ඇති අතර පවුලේ සාමාජිකයින් විදේශගතවීම හේතුකොටගෙන පවුල් තුළ ඇතිවන සමාජ ආර්ථික ප්‍රතිවිපාක අවම කිරීමටද අභ්‍යන්තර සංක්‍රමණ සමත්ව ඇති බව හෙළිදරව් වේ.

**ප්‍රමුඛ පද - තොරතුරු අවශ්‍යතා, පාඨක අධ්‍යාපනය, විශේෂ පුස්තකාල, තොරතුරු මූලාශ්‍ර, වෛද්‍ය පුස්තකාල**

---

1 පුස්තකාල හා විඥාපනවිද්‍යාව අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය isharanironi@gmail.com

2 පුස්තකාල හා විඥාපනවිද්‍යාව අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය